# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/48 – 2020 සැප්තැම්බර් 23 වැනි බදාදා – 2020.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 965/5 හා 1997.03.04 වැනි දින දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ ද, 1997 අංක 52 හා 1997.02.25 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාර ගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 965/5 හා 1997.03.04 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 1997 අංක 52 හා 1997.02.25 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,<br>ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/96/AS/1/283.<br>
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ක/ප්‍රාලේ/ඉ/2/2-87.<br>
2020 සැප්තැම්බර් මස 12 වැනි දින,<br>
ඉඩම් අමාත්‍යාංශය,<br>
'මිහිකත මැදුර',<br>
අංක 1200/6, රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, කෝන්ගස්තැන්න ගමේ පිහිටි හම්බන්තොට කොට්ඨාස භාර මැනුම් අධිකාරීගේ අංක H/KTW/96/290 හා 1996.12.14 දිනැති ප්‍රගමණ අණුරේඛනයේ සවිස්තරව දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.106 ක් පමණ වන කහඳයාහේන නැමති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කහඳයාහේන – ප්‍රමාණය: හෙක්. 0.106 ක් පමණ**

උතුරට: $5^P$ සහ 12; නැගෙනහිරට: 12; දකුණට: මාර්ගය; බටහිරට: $5^R$ සහ $5^P$.

10 - 312